ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
MCU 3205 - පර්යේෂණ ක්‍රමවේදය
අවසාන පරීක්ෂණය - 2009
කාලය - පැය තුනයි.

---

දිනය - 2009.02.07 වේලාව - ප.ව. 1.30 - ප.ව. 4.30 දක්වා

---

උපදෙස් - ඕනෑම ප්‍රශ්න පහක් (05) සඳහා පමණක් පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.

01. (අ) 'පර්යේෂණ ' යන්නෙන් කුමක් අදහස් කෙරේද ? පර්යේෂණ පිළිබඳව නිර්වචන කිහිපයක් ඉදිරිපත් කරමින් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 08)

(ආ) කළමනාකරණයේදී පර්යේෂණ සඳහා පොදුවේ භාවිතා වන ක්ෂේත්‍ර කවරේ ද? අඩු තරමින් එබඳු ක්ෂෙත්‍ර පහක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 12)

02. පර්යේෂණ සිදු කිරීමෙන්, කළමනාකරුවන් ලබාගන්නා ප්‍රයෝජන කවරේද ? එබඳු ප්‍රයෝජන පහක් පිළිබඳව පැහැදිලි කරන්න.
(ලකුණු 20)

03. වාණිජමය ආයතනයක් විසින් යොදාගෙන ඇති අභිප්‍රේරණ ක්‍රමයක් පිළිබඳව ඇගයීමක් කිරීමේ පර්යේෂණයක් සිදු කිරීමට ඔබ වෙත පවරා ඇතැයි උපකල්පනය කරන්න. මෙම අභිප්‍රේරණ ක්‍රමය 2000 වසරේ සිට මෙම ආයතනය තුළ ක්‍රියාත්මක වූ අතර පළමු පස්වසර තුළ ඒ පිළිබඳව සේවකයන් තෘප්තිමත් තත්වයක පැවතුණි. 2005 වර්ෂයේදී කළමනාකාරිත්වය විසින් මෙම ක්‍රමය සංශෝධනය කරන ලදී. කෙසේ වුවද, ඇතැම් සේවක කණ්ඩායම් මෙම ක්‍රමයට විරෝධය පෑ අතර ඒ පිළිබඳ පර්යේෂණයක් සිදු කර ගැටළුව හඳුනා ගැනීමටත් ඒ සඳහා විකල්ප ක්‍රියා මාර්ග ගැනීමටත් ඉහළ කළමනාකාරිත්වය අපේක්ෂා කරයි.

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා ඔබ විසින් යොදා ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන අදියරයන් කවරේදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

04. ආයතනයක, මානව සම්පත් කළමනාකරු විසින් තම ආයතනයේ සේවක මණ්ඩලයේ එක් එක් සේවකයාගේ කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය කර ඇත. ඔහුගේ මතය නම් පුහුණුව,වැඩ පරිසරය සහ සේවක වැටුප් ව්‍යුහය මෙම තත්‍වයට දැඩි බලපෑමක් කර ඇති බවයි. කෙසේ වුවද ඔහු විශ්වාස කරන්නේ වැටුප් වැඩි කිරීමකින් තෘප්තිමත් කළ හැක්කේ අමතර ආදායමක් නොමැති සේවකයන් පමණක් බවයි.

(අ) මෙම ආයතනයේ පවතින ගැටළුව අර්ථකථනය කරන්න.
(ලකුණු 03)

(ආ) මෙම ආයතනයේ පවතින තත්‍වය පිළිබඳව පර්යේෂණයක් කිරීම සඳහා යොදා ගත හැකි සංකල්පනාත්මක රාමුවක් පිළියෙල කර එහි ස්වායත්ත සහ පරායත්ත විචල්‍යයන් වෙන් වෙන්ව නම් කරන්න.
(ලකුණු 05)

(ඇ) ස්වායත්ත සහ පරායත්ත විචල්‍යයන් අතර ඇති සම්බන්ධතාවය පරීක්ෂා කළ හැකි වන කල්පිතයන් ගොඩ නගන්න.

(ලකුණු 06)

(ඈ) කල්පිතයන් පරීක්ෂා කිරීම සඳහා සුදුසු සංඛ්‍යාන (Statistical Techniques) ශිල්පක්‍රම යෝජනා කරන්න.

(ලකුණු 06)

05. (අ) පර්යේෂණයක් සිදු කිරීමේදී කල්පිත ගොඩනැගීම වැදගත් යයි ඔබ අදහස් කරන්නේ ඇයි? සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ආ) පර්යේෂකයින් විසින් යොදා ගනු ලබන විවිධ කල්පිත වර්ග(forms of hypotheses ) මොනවාද ? කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

06. පහත දැක්වෙන දෑ පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) වලංගුතාවය හා විශ්වසනීයභාවය (Validity and Reliability)
(ආ) ස්තෘත සසම්භාවී නියැදීම් ක්‍රමය (Stratified sampling method)
(ඇ) දත්ත රැස් කිරීමේ ශිල්පක්‍රම
(ඈ) ක්‍රියාකාරී පර්යේෂණ (Action Research)

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -